# Script: The contents of Freedom of Religion or Belief – conscientious objection
# ආගම ඇදහීමට හා විශ්වාසයන් දැරීමට ඇති අයිතියට ඇතුලත් වන දෑ - හෘදසාක්ෂියට එකඟව විරුද්ධවීම

ආගම ඇදහීමේ හා විශ්වාස දැරීමේ නිදහස ද සමගින් සිතීමේ හා හෘදසාක්ෂියේ නිදහස ද සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියේ 18වැනි වගන්තියෙන් ආරක්ෂා කර දී තිබෙනවා. එනිසා හෘදසාක්ෂියට එකඟව විරුද්ධවීමේ අයිතිය ආගම ඇදහීමට හෝ විශ්වාස දැරීමට ඇති නිදහසේ කොටසක් වනවා.

හෘදසාක්ෂියට එකඟව විරුද්ධ වීම යන්නෙන් අදහස් කරන්නේ එය කිරීමෙන් ඔබේ හෘදය සාක්ෂිය හෝ ආගමික විශ්වාසය උල්ලංඝනය වනබැවින් ඔබ කළ යුතු දෙයක් කිරීම ප්‍රතික්ෂේප කිරීමයි.

අනිවාර්ය හමුදා සේවය, දිවුරුම් දීම, රුධිර පාරවිලයනය ලැබීම හෝ සමහර වෛද්‍ය ක්‍රමවේදයන්ට සහභාගී වීම ප්‍රතික්ෂේප කිරීම සඳහා අයිතියක් ඇති දේවල් වශයෙන් ජනතාව පවසන දේට නිදසුන් වනවා. හෘද සාක්ෂියට එකඟව විරුද්ධවීම එක්සත් ජාතීන්ගේ ලේඛනවල නිශ්චිතවම සඳහන් කර ඇති එකම ආකාරය වන්නේ හමුදා සේවය ප්‍රතික්ෂේප කිරීමේ අයිතියයි. එය නීත්‍යානුකූල බැඳීමක් ඇතිකරවන ආකාරයේ එක්සත් ජාතීන්ගේ සම්මුතිවල හෝ මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයේ සඳහන් වන්නේ නැහැ. ඒ වෙනුවට, එය එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කමිටුවේ පොදු අදහස් 22 හි සඳහන් වනවා.

මෙය, සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියේ 18වැනි වගන්තිය රාජ්‍ය විසින් අර්ථනිරූපණය කළයුත්තේ කෙසේද කියා  විසින් එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මානව හිමිකම් පිළිබඳ විද්වතුන් විසින් පැහැදිලි කර දෙන ලේඛනයක්. එහි සඳහන්වන ආකාරයට, මනුෂ්‍ය ඝාතනය කිරීමට නියමකිරීම ඔබේ ආගම හෝ විශ්වාස ප්‍රකාශ කිරීමේ අයිතිය සමගින් සහ ඔබේ හෘද සාක්ෂිය සඳහා ඇති අයිතිය සමගින් බරපතළ ලෙස ගැටෙන්නේ නම්, හමුදා සේවය හෘදසාක්ෂියට එකඟව ප්‍රතික්ෂේප කිරීම  කිරීමට 18වැනි වගන්තියෙන් ඉඩ සලසනවා.

බොහෝ රටවල් මෙම අයිතිය පිළිගන්නා අතර විකල්ප ජාතික සේවා පද්ධති සහ නිදහස් කිරීම් ලබා දෙනවා. එහෙත් ආගමික හෝ සාමවාදී විශ්වාසයන් නිසා හමුදා සේවය ප්‍රතික්ෂේප කරන අය සිරගත කරන රාජ්‍යයන් ගණනාවක් තවමත් තිබෙනවා. මෙයින් වැඩිපුරම පීඩාවට පත්වූ කණ්ඩායම තමයි යෙහෝවාගේ සාක්ෂිකරුවන්. නිදසුනක් වශයෙන්, දකුණු කොරියාවේ යෙහෝවාගේ සාක්ෂිකරුවන් 389 දෙනෙකු 2016 දෙසැම්බර් මාසයේදී හෘද සාක්ෂියට එකඟව විරෝධය දැක්වීම සම්බන්ධයෙන් සිරදඬුවම් ලබා සිටියා.

එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් සංවිධානවලට අනුව, හෘදසාක්ෂියට එකඟව විරුද්ධවන සියලුදෙනාට  මිලිටරි නොවන විකල්ප සේවා විධිවිධාන කරා වෙනස්කම් කිරීමකින් තොරව ප්‍රවේශවීමේ හැකියාව තිබිය යුතුයි. හමුදා සේවයෙන් පීඩාවට පත් සෑම කෙනෙකුටම හෘද සාක්ෂියට එකඟව විරෝධය දැක්වීමේ අයිතිය සහ එය ඉල්ලා සිටින්නේ කෙසේද යන්න පිළිබඳ තොරතුරු ලබා හැකි විය යුතුයි. හමුදා සේවයට බඳවාගැනීමට පෙර හමුදාසේවය අතරතුර විරෝධතා දැක්වීමට බලයෙන් හමුදාවට බඳවාගත් හෝ ස්වේච්ඡාවෙන් බැඳුනු අයට ඉඩ තිබිය යුතුයි.

හෘද සාක්ෂියට එකඟව හමුදා සේවයට විරුද්ධවීමට අමතරව, හෘද සාක්ෂියට එකඟව කරන වෙනත් ආකාරවල විරුද්ධවීම් ද ජාතික මට්ටමින් පිළිගනු ලබනවා. මෙය ප්‍රධාන වශයෙන් සෞඛ්‍ය සේවයට සම්බන්ධ වනවා, උදාහරණයක් ලෙස ගබ්සා කිරීම ප්‍රතික්ෂේප කරන වින්නඹු මාතාවන් සහ

වෛද්‍යවරු සිටිනවා. සමහර රටවල සමරිසි පුද්ගලයින් අතර විවාහ සම්බන්ධයෙන් හෘදසාක්ෂියට එකඟ විරෝධතා මතු වී තිබෙනවා. බොහෝ අවස්ථාවල එකිනෙක සට්ටනය වන අයිතිවාසිකම් පිළිබඳ අසීරු ගැටළු මේවා තුළින් ඇතිවන්නට පුළුවනි. නිදසුනක් වශයෙන්, හෘද සාක්ෂියට එකඟව විරෝධය දැක්වීමේ අයිතිය කාන්තාවන්ගේ අයිතිවාසිකම් හෝ වෙනස් කොට සැලකීම් විරෝධී නීති සමඟ ගැටෙන්නේ නම් එසේ සිදුවන්නට ඉඩ තිබෙනවා.

හෘද සාක්ෂියට එකඟව විරෝධතා දැක්වීම සඳහා පැහැදිලි ජාත්‍යන්තර නීති සම්මතයක් තවමත් නැහැ. ඇත්ත වශයෙන්ම මෙම ගැටළුව ඉතා මතභේදාත්මක යි.

පහත දැක්වෙන්නේ ඔබට හමුවීමට බොහෝ දුරට ඉඩ ඇති තර්ක තුනක්:

හෘදසාක්ෂියට එකඟව විරෝධය දැක්වීම කියන්නේ ආගමක් හෝ විශ්වාසයක් ඇතිව සිටීමට ඔබට ඇති පරම අයිතියේ කොටසක් වන අතර එය කිසි විටෙකත් සීමා නොවිය හැකියි කියා සමහර අය තර්ක කරනවා. ඔවුන් තර්ක කරන්නේ තමන්ගේ හෘදය සාක්ෂිය අනුගමනය කිරීම වෙනුවෙන් කිසිදු දඬුවමක් ලැබීමට හෝ වියදමක් දැරීමට සිදු නොවිය යුතු බවයි. ඇත්ත වශයෙන්ම, භක්තිමත් සාමවාදියෙකු හා සොල්දාදුවෙකු වීම යන චරිත දෙකම නිරූපණය කිරීම කළ නොහැක්කක්, එනිසා සාමවාදීන්ට සොල්දාදුවන්වීමට බලකිරීම ආගමක් හෝ විශ්වාසයක් ඇතිව සිටීමට ඔවුන්ට ඇති අභ්‍යන්තර, පරම අයිතිය උල්ලංඝනය කිරීමක් වනවා.

තවත් සමහරු එය නිරපේක්ෂ අයිතියක් බව එකඟ වන නමුත් ඊට අදාළ වන වාතාවරණ මොනවාදැයි කියන කාරණය වැදගත් කියා ඔවුන් සිතනවා. ඔවුන් තර්ක කරන්නේ බලහත්කාරයෙන් හමුදාවට බඳවාගත් අයට, සිරකරුවන්ට සහ ඔවුන්ගේ තත්වය ගැන වෙනත් විකල්පයක් නැති අයට තමන්ගේ හෘදය සාක්ෂිය උල්ලංඝනය කිරීමට කිසි විටෙකත් බල නොකළ යුතු බවයි. නමුත් ස්වේච්ඡාවෙන් රැකියාවක් සඳහා ඉල්ලුම් කරන සහ එයින් ඉවත් වීමට නිදහස ඇති පුද්ගලයින්ට ඔවුන්ගේ සේවායෝජකයා ඔවුන්ගේ හෘදය සාක්ෂියට ඉඩ සලසෙනු ඇතැයි අපේක්ෂා කළ නොහැකියි. වෙනත් වචන වලින් කිවහොත්, ඔබේ හෘදය සාක්ෂියට අනුකූලව කටයුතු කිරීමට තෝරා ගැනීම සඳහා පිරිවැයක් දැරීමට සිදුවිය හැකියි.

තවත් සමහරු තර්ක කරන්නේ හෘදසාක්ෂියට එකඟව විරුද්ධ වීම ක්‍රියාවක් වන නිසා එය ඔබගේ හෘදය සාක්ෂියේ, ආගමේ හෝ විශ්වාසයන්ගේ ප්‍රකාශනයක් වන බවයි. අන් අයගේ අයිතිවාසිකම් සහ නිදහස, මහජන සෞඛ්‍යය, සාමය හෝ සදාචාරය ආරක්ෂා කිරීමට අවශ්‍ය අවස්ථාවන්හිදී පමණක් ප්‍රකාශනය සීමා කළ හැකියි. හෘද සාක්ෂියට හමුදා සේවයට බැඳීම ප්‍රතික්ෂේප කිරීම සම්බන්ධයෙන් ගත් කල, ජාතික ආරක්ෂාව යනු ආගම ඇදහීමට හෝ විශ්වාස දැරීමට ඇති නිදහස සීමා කිරීම සඳහා නීත්‍යානුකූල පදනමක් නොවන බව සැලකිල්ලට ගැනීම වැදගත් වනවා.

මේ ස්ථාවර අතරින් නිවැරදි ස්ථාවරය කුමක්ද යන්න සම්බන්ධයෙන්යෙන් නීති විශාරදයන් අතර එකඟතාවයක් නැහැ.

සාරාංශයක් ලෙස කියනවානම්, මේ වීඩියෝ පටයේ අපි හෘදසාක්ෂියට එකඟව විරුද්ධවීම සලකා බැලුවා. හෘද සාක්ෂියට එකඟව විරුද්ධවීම කියන්නේ, ඔබ විසින් සිදුකරනු ඇතැයි සාමාන්‍යයෙන් බලාපොරොත්තු වන දෙයක් ප්‍රතික්ෂේප කිරීමේ අයිතියයි. හෘදසාක්ෂියට එකඟව හමුදා සේවය ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය ජාත්‍යන්තර මානව හිමිකම් නීතියෙන් ආරක්ෂා කර දී තිබෙනවා. බොහෝ රටවල් මෙම අයිතිය පිළිගන්නා නමුත් සමහරු හෘදසාක්ෂියට එකඟව විරුද්ධවන තැනැත්තන් සිරගත කරනවා. බොහෝ රටවල් වෙනත් ආකාරවල හෘද සාක්ෂියට එකඟව විරුද්ධවීම් ද ජාතික මට්ටමින් පිළිගන්නවා. කොහොම නමුත් මේ අයිතිවාසිකම මතභේදාත්මක වන අතර මේ මාතෘකාව පිළිබඳ ජාත්‍යන්තර නීතිය මුළුමනින්ම සංවර්ධනය වී නැහැ.

මේ සම්බන්ධයෙන් සඳහන් වන මානව හිමිකම් ලේඛන ද ඇතුළුව, හෘද සාක්ෂියට එකඟව විරුද්ධවීම් සම්බන්ධයෙන් වැඩි විස්තර, වෙබ් අඩවියේ ඇති පුහුණු ද්‍රව්‍ය වලින් ඔබට සොයාගත හැකි වේවි.

Copyright: SMC 2018